OL/2024(2025)/11/S-I, II

සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

| 11 | S | I, II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)

**බුද්ධ ධර්මය I, II**
பௌத்தம் I, II
Buddhism I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## බුද්ධ ධර්මය I

**උපදෙස්:**

※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
※ අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
※ **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
※ එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** සුදොවුන් රජතුමා සිදුහත් කුමාරයා හට සෘතු තුනට අනුරූපීව වාසය කිරීමට මාළිගා තුනක් සාදවා දීමෙන් බලාපොරොත්තු වූ අරමුණු අතරට අයත් **නොවන** කරුණ වන්නේ,
(1) සක්විති රජකු වීමේ අපේක්ෂාවට බාධා ඇති නොකිරීම ය.
(2) ගෘහ ජීවිතයට වන බාධා මගහැරවීම ය.
(3) කාමභෝගී ජීවිතයකට සුදුසු ඒකායන මග පෙන්වාදීම ය.
(4) මාළිගාවෙන් පිටත ලෝකය යථාර්ථය බව අවබෝධ කරවීම ය.

**2.** ජීවිතයේ සාර්ථකත්වය සඳහා එළඹෙන අභියෝග ජයගත යුතු අතර ක්ෂණික තීරණ නොගෙන හොඳින් සිතා විමසා බලා ක්‍රියා කළ යුතු ය. මේ සඳහා සිදුහත් බෝසතාණන්ගේ චරිතයෙන් සපයන ආදර්ශය වන්නේ,
(1) කිං කුසලගවේසී වීම යන්න ය.
(2) පංච මහාවිලෝකනය යන්න ය.
(3) සිංහාවලෝකනය යන්න ය.
(4) අභිනිෂ්ක්‍රමණය කිරීම යන්න ය.

**3.** පන්සාළිස් වසක් වූ බුදු සිරිතේ මූලික ප්‍රත්‍ය පහසුකම් **නොලැබුණු** දුෂ්කර කාලසීමාවක් වන්නේ,
(1) පාරිලෙය්‍ය වනයේ වැඩ විසූ කාලයයි.
(2) වේරංජාවේ වැඩ විසූ කාලයයි.
(3) උරුවේලාවේ වැඩ විසූ කාලයයි.
(4) භේෂකලා පර්වතයෙහි වැඩ විසූ කාලයයි.

**4.** බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන්නේ ආමිස පූජාවට වඩා ප්‍රතිපත්ති පූජාව ශ්‍රේෂ්ඨ බව ය. ඉන් ප්‍රකට වන්නේ,
(1) ආමිස පූජාව මෙන්ම ප්‍රතිපත්ති පූජාව ද සමාන බව ය.
(2) දන් පහන් දීම නුසුදුසු බව ය.
(3) ධර්මානුකූලව ජීවත්වීම වඩා ශ්‍රේෂ්ඨ බව ය.
(4) ප්‍රතිපත්ති පූජාව පමණක් අනුමත කර ඇති බව ය.

**5.** තෙරුවන් සරණ යාම දෙවියකුගේ, බ්‍රහ්මයකුගේ හා මැවුම්කරුවකුගේ පිහිට පැතීමට වඩා වෙනස් වන්නේ එහි පදනම,
(1) ශ්‍රද්ධාව වන බැවිනි.
(2) සීලය වන බැවිනි.
(3) භක්තිය වන බැවිනි.
(4) විශ්වාසය වන බැවිනි.

**6.** "මා නිරෝගීව සිටියදී රෝගී වූ භික්ෂූන් වෙත උපස්ථානයට නොගිය බැවින් මා රෝගී අවස්ථාවේදී කිසිවෙකුත් පැමිණියේ නැත." මෙසේ භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දෙනු ලැබුයේ,
(1) මුළු සිරුරම වණ වී සිටි තෙරුන් විසිනි.
(2) ඇස් අන්ධ වී සිටි තෙරුන් විසිනි.
(3) රෝගීව පිප්ඵලී ගුහාවේ සිටි තෙරුන් විසිනි.
(4) දරුණු උදරාබාධයකින් පෙළුණු තෙරුන් විසිනි.

[දෙවැනි පිටුව බලන්න.

7. පුද්ගලයකුගේ උපතේ සිට මරණය දක්වාත් ඉන් පසුවත් නිශ්ශරණාධ්‍යාශයෙන්ම සමාජ මෙහෙවරෙහි යෙදෙන්නේ,
(1) පසේ බුදුවරයෙකි. (2) සක්විති රජෙකි.
(3) බෞද්ධ භික්ෂුවකි. (4) අනගාරික වූවෙකි.

8. සිද්ධාර්ථ කුමාරයා සරණ පාවාගත් භද්දකච්චානා කුමරියගේ පියාගේ නම කුමක් ද?
(1) මහානාම ශාක්‍ය රජ (2) සුප්‍රබුද්ධ ශාක්‍ය රජ
(3) අමිතෝදන ශාක්‍ය රජ (4) විඩූඩභ ශාක්‍ය රජ

9. "මා දෙන බතින් යැපෙන, මා සපයන යානයෙන් ගමන් යන, මා නිසා ජීවත්වන වඩුවෝ දෙදෙනා මා හට ගෞරව නොදක්වා ඔබ වහන්සේ කෙරෙහිම ගෞරව දැක්වූහ." බුදුරජාණන් වහන්සේට මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?
(1) කොසොල් මහරජතුමා (2) බිම්බිසාර මහරජතුමා
(3) සුද්ධෝදන මහරජතුමා (4) අජාසත් මහරජතුමා

10. පාරමිතා ගුණ ධර්ම පුරුදු පුහුණු කරන්නෙකු විසින් ඒවා කරුණු පහක් යටතේ සම්පූර්ණ කළ යුතු අතර ඊට අයත් **නොවන** කරුණ වන්නේ,
(1) තණ්හාවෙන් තොරව දානාදී ගුණ ධර්ම පිරීම ය.
(2) මානයෙන් තොරව දානාදී ගුණ ධර්ම පිරීම ය.
(3) මිථ්‍යාදෘෂ්ටියෙන් තොරව දානාදී ගුණ ධර්ම පිරීම ය.
(4) උපාය කෞශල්‍ය ඥානයෙන් තොරව ගුණ ධර්ම පිරීම ය.

11. සිවි ජාතක කථාවෙන් ප්‍රකට වන්නේ අප මහබෝසතාණන් වහන්සේ සම්පූර්ණ කළ කිනම් පාරමිතාව ද?
(1) වීර්ය පාරමිතාව (2) දාන පාරමිතාව
(3) මෛත්‍රී පාරමිතාව (4) උපේක්ෂා පාරමිතාව

12. සම්මා සම්බුද්ධ, පච්චේක බුද්ධ, අරහන්ත බුද්ධ ලෙස සත්‍ය අවබෝධ කරන ආකාර තුනක් ධර්මයේ දැක්වේ. එම තුන් ආකාරය,
(1) ත්‍රිශික්ෂා නම් වේ. (2) ත්‍රිලක්ෂණ නම් වේ.
(3) ත්‍රිවිධ රත්නය නම් වේ. (4) තුන්තරා බෝධිය නම් වේ.

13. 'දානං ච ධම්මචරියා ච' යන ගාථාවේ දැක්වෙන මංගල කරුණු අතරට අයත් **නොවන** කරුණු ඇතුළත් වරණය කුමක් ද?
(1) දානය, ධර්මයෙහි හැසිරීම, ඥාතීන්ට සංග්‍රහ කිරීම
(2) දන්දීම, සිල් රැකීම, භාවනාවෙහි යෙදීම
(3) දානය, ධර්මයෙහි හැසිරීම, නිවැරදි කර්මාන්ත කිරීම
(4) ඥාති සංග්‍රහය, නිවැරදි කර්මාන්ත කිරීම, දහමෙහි හැසිරවීම

14. පුද්ගලයා එදිනෙදා කළ යුතු කාර්යයන් පසුවට කල් තබමින් උදාසීනව කටයුතු කිරීම නීවරණ ධර්මයක් ලෙස ධර්මයෙහි දැක්වේ. එම නීවරණය,
(1) විචිකිච්ඡා නම් වේ. (2) උද්ධච්ච කුක්කුච්ච නම් වේ.
(3) ථීනමිද්ධ නම් වේ. (4) ව්‍යාපාද නම් වේ.

15. බෞද්ධ ඉගැන්වීම අනුව චිත්ත භාවනාව වැඩීමෙන් ලැබිය හැකි ඉහළම ප්‍රතිඵලය වන්නේ,
(1) චතුර්ථධ්‍යාන සහිත සප්ත සමාපත්තියයි. (2) චතුර්ථධ්‍යාන සහිත අෂ්ට සමාපත්තියයි.
(3) පංච අභිඥා සහිත සප්ත සමාපත්තියයි. (4) පංච අභිඥා සහිත අෂ්ට සමාපත්තියයි.

16. නැවත නැවත මැරි මැරී ඉපදි ඉපදී සැරිසරන පුහුදුන් සත්ත්වයාගේ මතු පැවැත්ම දැකිය හැකි නුවණ හැඳින්වෙන්නේ,
(1) පුබ්බේනිවාසානුස්සති ඤාණය නමිනි. (2) ඍද්ධිවිධ ඤාණය නමිනි.
(3) පරචිත්තවිජානන ඤාණය නමිනි. (4) චුතූපපාත ඤාණය නමිනි.

17. කර්මානුරූපව පුද්ගල විෂමතා ඇතිවන ආකාරය ප්‍රකට කෙරෙන චූල්ලකම්ම විභංග සූත්‍රයට අනුව ද්වේෂයෙන් කටයුතු කරන තැනැත්තා මතු භවයේ උපදින්නේ,
(1) රෝගියෙකු වී ය. (2) අඩු ආයුෂ ඇතිව ය.
(3) විරූපීව ය. (4) යසස් නැතිව ය.

18. සියලු කෙලෙසුන් නසා රහත්භාවයට පත් පුද්ගලයාට, කර්ම විපාකදීමට අවස්ථාවක් නොලැබී අවිපාක කර්ම බවට පත්වීම ධර්මයෙහි හැඳින්වෙන්නේ,
(1) ගරුක කර්ම ලෙස ය. (2) කටත්තා කර්ම ලෙස ය.
(3) ආචිණ්ණ කර්ම ලෙස ය. (4) අහෝසි කර්ම ලෙස ය.

[තුන්වැනි පිටුව බලන්න.

**19.** සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන පරිදි ගුරුවරයා විසින් ශිෂ්‍යයාට ඉටුකළ යුතු යුතුකම් අතරට අයත් **නොවන** කරුණ වන්නේ,
(1) මැනවින් හික්මවීම යන්න ය.
(2) අවමන් නොකිරීම යන්න ය.
(3) මැනවින් ඉගැන්වීම යන්න ය.
(4) හිතමිතුරන්ට හඳුන්වාදීම යන්න ය.

**20.** භද්දාලි සූත්‍රයේ සඳහන් වන පරිදි ආහාරයෙහි ප්‍රමාණය දැන අනුභව කිරීමෙන් ලැබෙන ප්‍රතිඵල ගණයට අයත් **නොවන** කරුණ වන්නේ,
(1) මනා කායික ශක්තිය ලැබීම යන්නයි.
(2) මනා මානසික බලය ලැබීම යන්නයි.
(3) රෝගාබාධ අඩු බව යන්නයි.
(4) සුවපහසු පැවැත්ම යන්නයි.

**21.** සමථ භාවනාවෙන් ශිෂ්‍ය ජීවිතයට ගතහැකි ප්‍රයෝජන අතරට අයත් **නොවන** කරුණ වන්නේ,
(1) මතක ශක්තිය දියුණු වීම ය.
(2) එක අරමුණක සිටීමට හැකි වීම ය.
(3) වහා අවබෝධ කරගැනීමේ ශක්තිය දියුණු වීම ය.
(4) සහජීවනයෙන් කටයුතු කිරීමට හැකි වීම ය.

**22.** දිය සිඳී ගිය පොකුණු තෙර පසුතැවුණු මහලු කොස්වා ලිහිණියකු මෙන් තරුණ කාලයේ මගහැරී ගිය දේ පිළිබඳ සිතමින් පසුතැවිලි නොවිය යුතු බව දැක්වෙන ධම්මපද ගාථාවේ මුල් දෙපදය වන්නේ,
(1) "උට්ඨානවතෝ සතිමතෝ - සුචිකම්මස්ස නිසම්මකාරිනෝ" යන්නයි.
(2) "අචරිත්වා බ්‍රහ්මචරියං - අලද්ධා යොබ්බනේ ධනං" යන්නයි.
(3) "නතං කම්මං කතං සාධු - යං කත්වා අනුතප්පති" යන්නයි.
(4) "යෝ ච වස්සසතං ජීවේ - දුස්සීලෝ අසමාහිතෝ" යන්නයි.

**23.** රසයෙහි ගිජු වූ නාස්තිකාර ස්ත්‍රියක හෝ පුරුෂයකු ගෘහ ආධිපත්‍යයෙහි තැබීම පිරිහීමට හේතුවක් වන බව දේශනා කරනු ලැබ ඇත්තේ,
(1) වසල සූත්‍රයේ ය.
(2) මංගල සූත්‍රයේ ය.
(3) පරාභව සූත්‍රයේ ය.
(4) සිගාලෝවාද සූත්‍රයේ ය.

**24.** සමාජයක ඉතා වැදගත් තැනක් ගන්නා කාන්තාවට විශේෂ ආරක්ෂාවක් සපයමින් ඔවුන්ගේ අභිවෘද්ධි සැලසීම රාජ්‍ය පාලකයාගේ වගකීමක් බව අවධාරණය වන බෞද්ධ රාජ්‍ය පාලන මූලධර්මය වන්නේ,
(1) සතර සංග්‍රහ වස්තුවයි.
(2) දස රාජ ධර්මයයි.
(3) සප්ත අපරිහානිය ධර්මයයි.
(4) සතර බ්‍රහ්ම විහරණයයි.

**25.** සතර ආකාර කර්ම විපාක අනුව, දෙවන ආත්මභාවයෙන් පසු නිවන් දැකීමට ප්‍රථම කවර හෝ භවයක විපාක දීමට ඉදිරිපත් වන කර්ම හැඳින්වෙන්නේ,
(1) උපපජ්ජවේදනීය කර්ම ලෙස ය.
(2) උපත්ථම්භක කර්ම ලෙස ය.
(3) අපරාපරියවේදනීය කර්ම ලෙස ය.
(4) ආචිණ්ණ කර්ම ලෙස ය.

**26.** පැමිණෙන දුක් කම්කටොලු සියල්ල කර්මයට පවරා නොදී ප්‍රඥාවෙන්, අධිෂ්ඨානයෙන් හා උත්සාහයෙන් ජය ගැනීමට ඉවහල් වන්නේ,
(1) උපධි සම්පත්තියයි.
(2) ප්‍රයෝග සම්පත්තියයි.
(3) කාල සම්පත්තියයි.
(4) ගති සම්පත්තියයි.

**27.** අටුවා ග්‍රන්ථවල සම්මා දිට්ඨිය පස් ආකාරයකින් විස්තර කොට ඇති අතර සෝවාන් ආදී මාර්ග සිත්වල පහළ වන සිව්සස් අවබෝධ කරගන්නා දැක්ම හඳුන්වන්නේ,
(1) ධ්‍යාන සම්මා දිට්ඨි ලෙස ය.
(2) විදර්ශනා සම්මා දිට්ඨි ලෙස ය.
(3) මාර්ග සම්මා දිට්ඨි ලෙස ය.
(4) ඵල සම්මා දිට්ඨි ලෙස ය.

**28.** අවෙච්චප්පසාද යනුවෙන් ධර්මයෙහි විස්තර වන පදයෙහි අර්ථය වන්නේ,
(1) බුදුරජාණන් වහන්සේගේ මහාපුරුෂ ලක්ෂණ දැක ඇති වන පැහැදීමයි.
(2) ත්‍රිවිධ රත්නයෙහි ඇති ගුණ හැඳින ඇති කරගන්නා පැහැදීමයි.
(3) ධර්මය අසා ක්ෂණිකව ඇති වන පැහැදීමයි.
(4) අවස්ථාවෝචිතව ඇති කරගන්නා පැහැදීමයි.

**29.** සසර දුක් නැතිවන ආකාරය පහදන පටිලෝම පටිච්ච සමුප්පාදයෙහි දැක්වෙන පරිදි නැවත, "සසරට එකතු නොවීම නිසා උපතක් සිදු නොවේ" යන්න ප්‍රකාශ වන්නේ,
(1) "වේදනානිරෝධා තණ්හානිරෝධෝ" යන්නෙනි.
(2) "තණ්හානිරෝධා උපාදානනිරෝධෝ" යන්නෙනි.
(3) "උපාදානනිරෝධා භවනිරෝධෝ" යන්නෙනි.
(4) "භවනිරෝධා ජාතිනිරෝධෝ" යන්නෙනි.

[හතරවැනි පිටුව බලන්න.

**30.** මෛත්‍රිය ප්‍රගුණ කිරීමෙන් ලැබෙන ආනිසංස ගණයට අයත් **නොවන** කරුණ වන්නේ,
(1) නොමිනිසුන්ට ප්‍රිය වීම යන්න ය. (2) දේව රැකවරණය ලැබීම යන්න ය.
(3) සිහිමුලාව මිය යෑම යන්න ය. (4) මරණින් මතු බඹලොව ඉපදීම යන්න ය.

**31.** යුතුකම් හා අයිතිවාසිකම් ඉටු නොකර තම අයිතිවාසිකම් සඳහා පමණක් සටන් වදින සමාජයකට තම තමන් සතු යුතුකම් පෙන්වාදෙන සූත්‍රධර්මය වන්නේ,
(1) පරාභව සූත්‍රයයි. (2) සිගාලෝවාද සූත්‍රයයි.
(3) මංගල සූත්‍රයයි. (4) වසල සූත්‍රයයි.

**32.** බහුජාතික හා බහුආගමික සමාජයක සහජීවනයෙන් ජීවත්වීම සඳහා ඉවහල් වන කරුණු ඇතුළත් බෞද්ධ ඉගැන්වීම වන්නේ,
(1) සතර සංග්‍රහ වස්තුවයි. (2) සතර අගතියයි.
(3) සතර සෘද්ධිපාදයි. (4) සතර සතිපට්ඨානයයි.

**33.** රටක පවත්නා නීතියට අනුගතව, වරදකරුවන්ට දඬුවම් පැමිණවීමෙන් බැහැර නොවී, හිංසාකාරී ක්‍රියාවලින් තොරව රාජ්‍ය පාලනය කිරීම දස රාජධර්මවල හඳුන්වන්නේ,
(1) තපස ලෙස ය. (2) මෘදුබව ලෙස ය.
(3) අක්‍රෝධය ලෙස ය. (4) අවිහිංසාව ලෙස ය.

**34.** පළමුවන ධර්ම සංගායනාවේදී ධර්මය කටපාඩමින් පවත්වාගෙන යාමට භාණක පරම්පරාවලට පැවරුණු අතර සංයුත්ත නිකාය කටපාඩමින් පවත්වාගෙන යාමට පවරනු ලැබූයේ,
(1) ආනන්ද තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ය.
(2) සැරියුත් තෙරුන්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ය.
(3) අනුරුද්ධ තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ය.
(4) මහාකාශ්‍යප තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ය.

**35.** දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල ගණයට අයත් **නොවන** කරුණ වන්නේ,
(1) දස වස්තුව ප්‍රතික්ෂේප කිරීමයි. (2) අටළොස් නිකාය බිහිවීමයි.
(3) දුසිල් මහණුන් සසුනින් නෙරපීමයි. (4) විනය විරෝධීව කටයුතු කළ භික්ෂූන්ට නිග්‍රහ කිරීමයි.

**36.** පරවාද පන්සියයක් ඛණ්ඩනය කොට සකවාද පන්සියයක් ඇතුළත් කොට මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ සම්පාදනය කළ ග්‍රන්ථය වන්නේ,
(1) ධාතුකථාප්පකරණයයි. (2) ධම්මසංගණිප්පකරණයයි.
(3) පට්ඨානප්පකරණයයි. (4) කථාවත්ථුප්පකරණයයි.

**37.** ගන්ධාර ප්‍රදේශයෙන් හමු වූ කාසියක හා ධාතු කරඬුවක බුද්ධරූප දක්නට ලැබීමෙන් පෙනී යන්නේ ග්‍රීක-රෝම කලාවේ ආභාසයෙන් බුදුපිළිම නෙළීම ආරම්භ වූ බව ය. මෙසේ බුද්ධ ප්‍රතිමාව ආරම්භ වූයේ,
(1) මෞර්ය රාජ්‍ය සමයේ ය. (2) අශෝක රාජ්‍ය සමයේ ය.
(3) කණිෂ්ක රාජ්‍ය සමයේ ය. (4) කෝසල රාජ්‍ය සමයේ ය.

**38.** ගන්ධකුටි, පාසාද, ගේඩිගේ, ටැම්පිට විහාර යන නම්වලින් හඳුන්වා ඇත්තේ,
(1) බෝධිඝරයයි. (2) ප්‍රතිමාඝරයයි. (3) පධානඝරයයි. (4) චේතියඝරයයි.

**39.** මහියංගන ස්තූපය, කැලණි විහාර ස්තූපය, අභයගිරිය යන ස්තූපවල ආකෘති පිළිවෙළින් දැක්වෙන නිවැරදි වරණය වන්නේ,
(1) ඝණ්ටාකාර, ධාන්‍යාකාර, බුබ්බුලාකාර යන්න ය.
(2) ඝටාකාර, ඝණ්ටාකාර, බුබ්බුලාකාර යන්න ය.
(3) ඝණ්ටාකාර, ධාන්‍යාකාර, ඝටාකාර යන්න ය.
(4) ධාන්‍යාකාර, බුබ්බුලාකාර, පද්මාකාර යන්න ය.

**40.** බුදුරජාණන් වහන්සේ දෙව්ලොව සිට සංකස්සපුරයට වැඩම කිරීම සහ සස, වෙස්සන්තර, සාම ආදී ජාතක කථා චිත්‍රයට නගා ඇති පොළොන්නරු යුගයට අයත් චිත්‍ර දක්නට ලැබෙන ස්ථානය වන්නේ,
(1) දිඹුලාගල ලෙන් විහාරයයි. (2) තිවංක පිළිමගෙයයි.
(3) හිඳගල විහාරයයි. (4) දඹුලු විහාරයයි.

* *

[පස්වැනි පිටුව බලන්න.

සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

11 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)

බුද්ධ ධර්මය I, II
பௌத்தம் I, II
Buddhism I, II

## බුද්ධ ධර්මය II

※ **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
※ පළමුවැනි ප්‍රශ්නයට ලකුණු **20** ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** (i) සිදුහත් කුමරුගේ සුළු මවගේ නම කුමක් ද?
(ii) වණ්ණුපථ ජාතක කථාවෙන් හෙළිවන්නේ සිදුහත් බෝසතාණන් සම්පූර්ණ කළ කවර පාරමිතාව ද?
(iii) "මාගේ මේ ව්‍යායාමය හුදෙක් රජ සැප පිණිස නොව සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහාමය" යන ආදර්ශ පාඨය පෙරදැරි කරගෙන කටයුතු කළ රාජ්‍ය පාලකයාගේ නම කුමක් ද?
(iv) "යේ ධම්මා හේතුප්පභවා - තේසං හේතුං තථාගතෝ ආහ" මෙම පාඨයේ තේරුම ලියන්න.
(v) "තණ්හා පච්චයා උපාදානං" යන්නෙහි අර්ථය දක්වන්න.
(vi) "ලාභෝ අලාභෝ අයසෝ යසෝ ච" යන ගාථාවෙන් අදහස් වන්නේ කිනම් ධර්ම කරුණක් පිළිබඳව ද?
(vii) පළමුවන හා දෙවන ධර්ම සංගායනා සඳහා අනුග්‍රහය ලබා දුන් පාලකයින් **දෙදෙනාගේ** නම් ලියන්න.
(viii) 'මනෝකම්ම' ගණයට වැටෙන අකුසල් අතුරෙන් **දෙකක්** නම් කරන්න.
(ix) 'අමාවතුර' රචනා කළ කතුවරයාගේ නම ලියන්න.
(x) වැලිවිට සරණංකර සංඝරාජ මාහිමිපාණන් විසින් රචනා කරනු ලැබූ ග්‍රන්ථ **දෙකක්** නම් කරන්න.

**2.** (i) 'තාදී ගුණය' ධර්මානුකූලව විවරණය කරන්න.
(ii) 'තාදී ගුණය' බුද්ධ චරිතයෙන් ප්‍රකට වූ අවස්ථා **තුනකට** නිදසුන් දක්වන්න.
(iii) ශිෂ්‍ය ජීවිතය සාර්ථකත්වයට පත්කර ගැනීම සඳහා 'තාදී ගුණය' අදාළ කරගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

**3.** (i) 'චාරිත්‍ර වාරිත්‍ර' (සිරිත් විරිත්) යන වචන ධර්මානුකූලව අර්ථ දක්වන්න.
(ii) සිල් රැකීමෙන් ලැබෙන ආනිසංස පහෙන් **තුනක්** ලියා දක්වන්න.
(iii) සිල්වත් වීම පුද්ගල සංවර්ධනයට මෙන්ම සමාජ සංවර්ධනයට ද ඉවහල් වන ආකාරය පහදන්න.

**4.** (i) "තං ච කම්මං කතං සාධු" යන ධම්මපද ගාථාව සම්පූර්ණ කර ලියන්න.
(ii) ඉහත (i) ගාථාවේ අදහස ලියන්න.
(iii) දස කුසල් වැඩීම තුළින් සාර්ථක පුද්ගලයකු විය හැකි ආකාරය පැහැදිලි කරන්න.

**5.** (i) චතුරාර්ය සත්‍ය ධර්මවලින් **දෙකක්** නම් කරන්න.
(ii) ඉහත (i) හි නම් කළ **එක්** සත්‍යයක් කෙටියෙන් විස්තර කරන්න.
(iii) ගැටලු තේරුම්ගෙන විසඳා ගැනීමේ හොඳම මග චතුරාර්ය සත්‍ය බව පැහැදිලි කරන්න.

[හයවැනි පිටුව බලන්න.

6. (i) සතර අගතිවලට අයත් කරුණු **දෙකක්** ලියන්න.
(ii) ඉහත (i) හි සඳහන් **එක්** කරුණක් කෙටියෙන් පැහැදිලි කරන්න.
(iii) පරමාදර්ශී පාලන තන්ත්‍රයක් උදෙසා සතර අගතියෙන් තොරවීමේ වැදගත්කම ඇගයීමට ලක් කරන්න.

7. පහත සඳහන් මාතෘකා අතුරෙන් **දෙකකට** කෙටි සටහන් ලියන්න.
(i) අනගාරික ධර්මපාලතුමා.
(ii) දුමින්දාගමනය.
(iii) විචිකිච්ඡා නීවරණය.
(iv) වටදාගෙය.

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි.


රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2024 (2025)

# 11 - බුද්ධ ධර්මය

ලකුණු දීමේ පටිපාටිය



මැදිරිගිරිය වටදාගෙය

මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2024 (2025)

# 11 - බුද්ධ ධර්මය
## අවසාන ලකුණු ගණනය කිරීම

| | | | | |
|---|---|---|---|---|
| **I පත්‍රය :** | බහුවරණ ප්‍රශ්න 40 කි | = | (1 x 40) | **ලකුණු 40 යි** |
| **II පත්‍රය :** | 1 වැනි ප්‍රශ්නය | | කොටස් 10 කි කෙටි පිළිතුරු (2 x 10) | **ලකුණු 20 යි** |

2 වැනි ප්‍රශ්නය (2 - 7 තෙක් තෝරාගත් ප්‍රශ්න 04 කට)

| | | |
|---|---|---|
| i | ලකුණු 2 | |
| ii | ලකුණු 3 | |
| iii | ලකුණු 5 | ලකුණු 10 යි. |

3 වැනි ප්‍රශ්නය

| | | |
|---|---|---|
| i | ලකුණු 2 | |
| ii | ලකුණු 3 | |
| iii | ලකුණු 5 | ලකුණු 10 යි. |

4 වැනි ප්‍රශ්නය

| | | |
|---|---|---|
| i | ලකුණු 2 | |
| ii | ලකුණු 3 | |
| iii | ලකුණු 5 | ලකුණු 10 යි. |

5 වැනි ප්‍රශ්නය

| | | |
|---|---|---|
| i | ලකුණු 2 | |
| ii | ලකුණු 3 | |
| iii | ලකුණු 5 | ලකුණු 10 යි. |

6 වැනි ප්‍රශ්නය

| | | |
|---|---|---|
| i | ලකුණු 2 | |
| ii | ලකුණු 3 | |
| iii | ලකුණු 5 | ලකුණු 10 යි. |

7 වැනි ප්‍රශ්නය එක් කොටසකට ලකුණු 5 බැගින්

(ලකුණු 5 x 2 ) ලකුණු 10 යි.

**ලකුණු 40 යි.**
**මුළු ලකුණු 100 යි.**

**අවසාන ලකුණු ගණනය කිරීම**

| | |
|---|---|
| I පත්‍රයට ලකුණු | = 40 |
| II පත්‍රයට ලකුණු | = 60 |
| **මුළු ලකුණු** | = 100 |

**ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුලත් කළ යුතු ආකාරය.**

I පත්‍රය මුළු ලකුණු ඉලක්කම් 2 කින් ඇතුළත් කළ යුතුය.

II පත්‍රය මුළු ලකුණු ඉලක්කම් 3 කින් ඇතුළත් කළ යුතුය.

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2024 (2025)
## උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

1. සෑම සහකාර පරීක්ෂකවරයකුම උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. ප්‍රධාන පරීක්ෂක විසින් දම්පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කළ යුතුය.
3. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ලකුණු සටහන් කිරීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
4. ඉලක්කම් ලිවීමේ දී යම් වැරදීමක් සිදු වුවහොත් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
5. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.
6. ගණිත පරීක්ෂක විසින් ලකුණු නිවැරදි බව සටහන් කිරීමට නිල් හෝ කළු පෑනක් භාවිතා කළ යුතුය.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ............................................................ √ △ 4/5

(ii) ............................................................ √ △ 3/5

(iii) ............................................................ √ △ 3/5

(03) (i) (ii)  4/5 + (ii) 3/5 + (iii) 3/5 —එකතුව→ □ 10/15

**බහුවරණ උත්තරපත්‍ර :**

01. කවුළු පත්‍රය සැකසීම

I. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න.

II. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න.

III. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න.

IV. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න.

V. විෂය අංකය හා විෂය පැහැදිලිව පෙනෙන ආකාරයට එම කොටු ද කපා ඉවත් කරන්න.

**VI. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. **අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබිය හැක. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.**

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි ඇඳ වැරදි දමන්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණු ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

I. එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ.

II. එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතුය.

III. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.**

IV. II පත්‍රයේ ලකුණු ලැයිස්තුව සැකසීමේ දී විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න.

V. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

VI. 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

**සැ.යු :- (I) සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

**(II) ලකුණු ලැයිස්තුවල සෑම පිටුවකම ලකුණු ඇතුළත් කළ සහකාර පරීක්ෂක, ලකුණු පරීක්ෂා කළ සහකාර පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක හා ප්‍රධාන පරීක්ෂක තම සංකේත අංකය යොදා අත්සන් කිරීමෙන් නිරවද්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය වේ.**

***

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2024 (2025)

# 11 - බුද්ධ ධර්මය

**සවිස්තර ලකුණු දීමේ පටිපාටිය**

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ඇතුළත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවේ දැක්වෙන පරිදි ජාතික අධ්‍යාපන පද්ධතිය මගින් ඉටුකරගත යුතු ජාතික පොදු අරමුණු 08 ක් වේ. එසේම මූලික නිපුණතා 07 ක් දැක්වේ. විධිමත් අධ්‍යාපනය මගින් මෙකී අරමුණු හා නිපුණතා සාක්ෂාත් කර ගැනීම අපේක්ෂිතය. මූලික නිපුණතා අතර පස් වැන්න ආගම හා ආචාර ධර්මයන්ට අදාළ නිපුණතාව වේ. එය පහත දැක්වේ.

5. ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතාව

"පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සාදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයන් උකහා ගැනීම හා ස්වීයකරණය."

පාසල් පද්ධතියේ ක්‍රියාත්මක සමස්ත විෂයමාලාව තුළින් පොදු අරමුණු හා මූලික නිපුණතා ඉටුකරගත යුතු අතර, ආගමික අධ්‍යාපනය තුළින් ඉහත දැක්වෙන පස්වන නිපුණතාව සුවිශේෂීව සපුරාගත යුතුව පවතී.

බුද්ධ ධර්මය විෂය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී එහි විෂය කරුණු ප්‍රායෝගිකත්වයට නැඹුරු කරවීම වර්තමාන යුගයට අත්‍යවශ්‍යව පවතී. වනපොත්කරණයෙන් විෂය කරුණු හදාරා විභාග සමත්වීම එකම අරමුණ නොවිය යුතු අතර, ඉන් ඔබ්බට ගොස් දෛනික ජීවිතයේ විවිධ ගැටලුවලට සාර්ථකව මුහුණ දීමටත්, දහම් කරුණු භාවිතයට ගැනීමටත්, බුදු දහමේ ඉගැන්වෙන ශ්‍රේෂ්ඨ ධර්ම කරුණු අනුව තම ජීවිතය සාර්ථක කරගැනීමටත් සිසුන් යොමු කරලීම අත්‍යවශ්‍ය වේ. සමබර පෞරුෂයකින් හෙබි සැදැහැති බෞද්ධයකු දැයට දායාද කිරීම බුදු දහම ඉගැන්වීමේ මූලික අරමුණු විය යුතුය. බුද්ධ ධර්මය විෂය උගන්වන ගුරුවරයා මේ පිළිබඳ සුවිශේෂීව අවධානය යොමු කළ යුතුවේ.

නව විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ සැකසුන විෂයමාලාවක් පාසල් පද්ධතියට ඉදිරිපත් කෙරිණි. ඒ අනුව බුද්ධ ධර්මය විෂයයේ අරමුණු 07 ක් දැක්වේ. මෙම අරමුණු සපුරාලන අයුරින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සකසා ගත යුතුවේ. එම විෂය අරමුණු මෙසේයි.

## විෂයයේ අරමුණු

01. ත්‍රිවිධ රත්නයේ ගුණ හැඳින, ශ්‍රද්ධාවෙන් කටයුතු කරන, නිවැරදිව ප්‍රායෝගික වතාවත්වල යෙදෙන දැහැමි දරු පරපුරක් බිහිකිරීම.

02. ජීවන ගමනේ දී මුහුණ දෙන අභියෝග ජය ගැනීමට සහ නිවැරදි ජීවන දර්ශනයක් ගොඩනගා ගැනීමට බුදු දහමෙහි මූලික ඉගැන්වීම් උපයෝගී කර ගැනීම පිණිස දරු පරපුරට මග පෙන්වීම.

03. සුපෞරුෂයක් ගොඩනගා ගැනීම උදෙසා බෝසත් චරිතය, බුද්ධ චරිතය හා සිව්වනක් පිරිසට අයත් ශ්‍රේෂ්ඨ චරිත ආදර්ශ කොට ගැනීම සඳහා මග පෙන්වීම.

04. ශ්‍රී ලාංකේය උරුමය දයාද කොට ගත් අභිමානවත්, වගකීමෙන් සහ වගවීමෙන් යුතු දරු පරපුරක් ගොඩනගා ගැනීම.

05. සිය ජීවන දර්ශනය ගොඩනගා ගැනීමේ දී ධම්මපද දේශනා සහ බෞද්ධ උපදේශ කාව්‍ය පදනම් කරගත් ඉගැන්වීම් චරිතායනයට මග පෙන්වීම.

06. මානසික ඒකාග්‍රතාවෙන් යුතු සුසමාහිත පෞරුෂයක් ගොඩනගා ගැනීම සඳහා භාවනාව ප්‍රගුණ කිරීමට යොමු කරවීම.

07. බෞද්ධ ශිෂ්ටාචාරයෙහි සුවිශේෂ අංග අධ්‍යයනය කොට, සහජීවනයෙන් කටයුතු කරන සිය අනන්‍යතාව රැක ගත් දරු පරපුරක් ගොඩනගා ගැනීම.

එසේම 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය තෙක් ද්විතීයික විෂය නිර්දේශය මූලික නිපුණතා 10 ක් යටතේ ගොනු කර ඇත. 6 ශ්‍රේණියේ සිට නිපුණතා මට්ටම් හා විෂය අන්තර්ගතය ක්‍රමයෙන් ගැඹුරින් හා පළලින් වැඩිවන ලෙස සර්පිලාකාර ක්‍රමයට ව්‍යාප්ත වන ලෙස සැකසී ඇත. බුද්ධ ධර්මය විෂයයේ නිපුණතා 10 පහත දැක්වේ.

## බුද්ධ ධර්මය විෂයයේ නිපුණතා

01). තෙරුවන් ගුණ හැඳින චරිතායනය කරයි.
02). ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක, ශ්‍රාවිකා චරිත උපයෝගී කර ගනියි.
03). බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි.
04). සුසමාහිත සමබර පෞරුෂයක් ගොඩනගා ගැනීමට කටයුතු කරයි.
05). ශ්‍රී ලාංකික බෞද්ධ අනන්‍යතාව සුරකිමින් සාමයෙන් හා සහජීවනයෙන් ක්‍රියා කරයි.
06). බුදු දහමට අනුව ජීවිතය හා ලෝකය හැඳිනගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි.
07). ජීවී, අජීවී පරිසරයට හිතකාමීව හැසිරෙයි.
08). ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකේය බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි.
09). බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳිනගෙන ඒ අනුව ක්‍රියා කරයි.
10). නිර්වාණය අරමුණු කොට ගෙන ආර්ය මාර්ගයේ ගමන් කරයි.

ඉහත දැක්වූ විෂය අරමුණු 07 පෙරදැරි කරගෙන නිපුණතා 10 සම්පූර්ණ වන ලෙස විෂය ඉගැන්වීම සාර්ථකව සිදු කළේ නම් සිසුන් තුළ යහපත් ගුණවගාවන් සිදුවනු ඇත. මෙම අවශ්‍යතාවන් ඉටුවන ලෙස ප්‍රායෝගිකත්වයට නැඹුරුව තක්සේරුකරණය පාසල් පාදකව සිදුවිය යුතුය. අ.පො.ස. (සා.පෙළ) විභාගය යනු විෂය දැනුම පිළිබඳ සමාප්තික ඇගයීම වේ.

බුද්ධ ධර්මය විෂයය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වෙයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ මෙම ප්‍රශ්න පත්‍ර සැකසී ඇත. නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රියාවලියකට සිසුන් යොමු කිරීම නව විෂයමාලා ප්‍රතිසංස්කරණවලින් අපේක්ෂිතය. නිපුණතාවක් (Competency) යනු දැනුම (Knowledge) ආකල්ප (Attitude) කුසලතා (Skills) සහ යහ පුරුදු (Good Practices) යන මේවායේ සමස්ත එකතුවේ ප්‍රතිඵලය වෙයි. දිගුකාලීනව ලැබූ ඉගෙනුම් ක්‍රියාවලියේ අවසාන ඵලය නිපුණතාවන්ගෙන් පිරි සම්බර පෞරුෂයෙන් යුතු යහපත් පුරවැසියන් වේ. බුද්ධ ධර්මය විෂයය න්‍යායාත්මකව සහ ප්‍රායෝගිකව හැදෑරීම තුළින් ආගම විෂයයට අදාළ නිපුණතා ශිෂ්‍යයා සපුරා ගෙන ඇත යනු අපගේ විශ්වාසයයි. ඇගයීම් ක්‍රියාවලිය ද නිපුණතා පාදකව සිදුකරලීම සඳහා ප්‍රයත්න දරා ඇත. අදාළ නිපුණතාව ශිෂ්‍යයා අත් කර ගෙන තිබේද යන්න මැන බැලීමට උචිත අයුරින් බොහොමයක් වණු සැකසී ඇති බව සිහියේ තබාගත යුතුය.

මෙම විෂයය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වෙයි. පළමුවැන්න බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. දෙවැන්න කෙටි පිළිතුරු සැපයීමේ හා ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්නවලින් යුක්තය. මෙම ප්‍රශ්න පත්‍ර සඳහා ලකුණු වෙන් කොට ඇත්තේ මතු දැක්වෙන පරිදි වේ.

| | | |
|---|---|---|
| I | - පත්‍රය ලකුණු | 40 යි |
| II | - පත්‍රය ලකුණු | 60 යි |
| | **මුළු ලකුණු** | **100 යි** |

# බුද්ධ ධර්මය - I

01. අධ්‍යාපන ක්‍රියා පද්ධතිය මගින් ශිෂ්‍ය - ශිෂ්‍යාවන් තුළ දැනුම ආකල්ප හා කුසලතා ප්‍රවර්ධනය කිරීම මූලික අභිමතාර්ථය වෙයි. හුදු දැනුම පමණක් යහපත් ශිෂ්ට සම්පන්න පුරවැසියකු බිහි කිරීමට ප්‍රමාණවත් නොවේ. අංග සම්පූර්ණ පුරවැසියකු වීමට යහපත් ආකල්ප පෝෂණයක් ද තදනුබද්ධව සංවර්ධනය විය යුතු පුද්ගල කෞශල්‍යය ද අත්‍යාවශ්‍ය වෙයි. බුද්ධ ධර්මය විෂයය නිර්දේශය සැකසී ඇත්තේ දැනුම, අකල්ප හා කුසලතා වර්ධනය සඳහාය. ඒ සඳහා බුද්ධ ධර්මය පාඨග්‍රන්ථ මගින් විශාල ප්‍රයත්නයක් දරා ඇති අතර, ආකල්ප හා කුසලතා වර්ධනය විෂයය භාර ගුරු මහත්ම මහත්මීන්ගේ දායකත්වය මගින් පෝෂණය කිරීම අපේක්ෂිතය. බුද්ධ ධර්මය ආගමික විෂයය නිර්දේශයක් වුවද එමගින් හුදු දැනුම පමණක් මනිනු නොලැබේ. ප්‍රශ්න සැකසී ඇත්තේ දැනුම, ආකල්ප සහ කුසලතා විනිශ්චය කිරීම සඳහාය.

02. ප්‍රශ්න හතළිහකින් යුත් පළමුවැනි ප්‍රශ්න පත්‍රය සඳහා වෙන්ව ඇති කාලය පැයකි. ප්‍රශ්න පත්‍රයේ ම දැක්වෙන පිළිතුරු හතරකින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ලකුණු කිරීම විභාග අපේක්ෂකයා විසින් කළ යුතුය.

03. ප්‍රශ්නයට අදාළ පිළිතුර සේ පෙනෙන එහෙත් නිවැරදි පිළිතුරු නොවන පිළිතුරු තුනක් තිබේ. දී ඇති පිළිතුරු සටහනින් නිවැරදි පිළිතුර තෝරා ගැනීම සඳහා බුද්ධ ධර්මය මැනවින් හදාරා තිබිය යුතුය.

04. අසා ඇති ප්‍රශ්න වහා අවබෝධකර ගැනීමේ ශක්තිය විභාග අපේක්ෂකයා සතු විය යුතුය. ප්‍රශ්නය නිසි ලෙස තේරුම් නොගැනීම අසාර්ථක පිළිතුරක් සැපයීමට හේතු විය හැකිය. ප්‍රශ්නය නිවැරදිව තේරුම් ගැනීමෙන් පසු නොපමාව නිවැරදි පිළිතුර කුමක්දැයි හඳුනාගෙන ලකුණු කළ යුතුයි.

05. පැයක පමණ කෙටි කාලයක් තුළ මේ සියලු කාර්යයන් ඉටු කළ යුතුව ඇති බැවින් ප්‍රශ්න පිළිබඳව නිරවුල් අවබෝධ ඥානය හා කාර්යක්ෂමභාවය සාර්ථක පිළිතුරු සැපයීමට බෙහෙවින් උපකාරවත් වේ.

06. සරල ප්‍රශ්න හතළිහකින් යුත් මේ ප්‍රශ්න පත්‍රයෙන් බලාපොරොත්තු වන්නේ බුද්ධ ධර්මය විෂයය සම්බන්ධ සාමාන්‍ය දැනීම පරීක්ෂාකර බැලීමය.

07. මේ ප්‍රශ්න පත්‍රයේ පිළිතුරුපත් ලකුණු කිරීමට පළමු පහත සඳහන් කරුණු කෙරෙහි පරීක්ෂකවරුන්ගේ දැඩි අවධානය යොමුවිය යුතුය.

i. නිවැරදි වරණය තේරීමේ දී අපේක්ෂකයා ලකුණු කොට ඇත්තේ එක් වරණයක් පමණක් දැයි බලන්න. එක් වරණයකට වඩා වැඩි සංඛ්‍යාවක් ලකුණු කොට ඇත්නම් එම පිළිතුර ඉරක් ඇඳ කපා හරින්න.

ii. සිදුරුපත් භාවිත කරන පරීක්ෂකවරුන් ප්‍රශ්නයේ අංකයත්, නිවැරදි පිළිතුරත් පැහැදිලිව පෙනෙන සේ සිය සිදුරුපත සකස්කර ගත යුතුය.

iii. සිදුරුපත් මගින් හරි වැරදි ලකුණු කිරීමේ දී නිවැරදි වරණය සඳහන් කොටුව මත ලකුණු කිරීමෙන් වලකින්න. පිළිතුරට අදාළ ප්‍රශ්න අංකය ඉදිරියෙහි හරි වැරදි ලකුණු කරන්න.

iv. නිවැරදි ලකුණු සංඛ්‍යාව ගණනය කොට අදාළ පේළිය යට මුළු සංඛ්‍යාව සටහන් කරන්න.

08. බුද්ධ ධර්මය ප්‍රශ්න පත්‍රයට අදාළ නිවැරදි උත්තර මතු දැක්වෙන සටහනෙහි පළවෙයි. නිවැරදි උත්තරයට එක් (01) ලකුණක් බැගින් හිමිවේ.

# බුද්ධ ධර්මය - II

01. නව අධ්‍යාපන විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ විභාගය පැවැත්විණි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය නිපුණතා පාදකව (Competency Based) ක්‍රියාකාරකම් පාදකව (Activity Based) සිදුවන අතරම ඇගයීම් හා තක්සේරුකරණ ක්‍රියාවලියද නිපුණතා පාදකව නිර්ණායක මූලිකව (Competency Based Criterion Reference Assessment and Evaluation) සිදුකිරීමට ප්‍රයත්න දරා ඇත. නිපුණතාවක් දැනුම ආකල්ප කුසලතා හා යහපුරුදුවලින් යුක්ත වෙයි. නිපුණතාවක් දිගුකාලීනව ඇතිවන්කි. ආගම හා සදාචාරයට අදාළ නිපුණතාවන් මෙන්ම බුද්ධ ධර්මය විෂයානුබද්ධ නිපුණතාවයන් ශිෂ්‍යයා ලබාගෙන තිබේද යන්න මැන බැලීම සඳහා ප්‍රශ්න පත්‍රය සැකසී ඇත.

බුද්ධ ධර්මය විෂය ක්ෂේත්‍රය පිළිබඳ අපේක්ෂකයා තුළ නිවැරදි අවබෝධය හා විෂය කරුණු විස්තරාත්මකව ඉදිරිපත් කිරීමේ හැකියාව ද, තමන් උගත් විෂය කරුණු ජීවිතය හා සමාජය සම්බන්ධ කොට විශ්ලේෂණය කිරීම සම්බන්ධයෙන් දක්වන නිපුණතා ද විමසා බැලීම මේ ප්‍රශ්න පත්‍රයේ අභිමතාර්ථය වෙයි.

02. බුද්ධ ධර්මය II ප්‍රශ්න පත්‍රයෙහි මතු දැක්වෙන උපදෙස් දී ඇත.

පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

★ පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු 10 ක් බැගින් ද හිමි වේ.

ඒ අනුව එක් එක් ප්‍රශ්නයට, කොටස්වලට ලකුණු ප්‍රදානය කිරීමේදී දිය යුතු ලකුණු ප්‍රමාණය මතකයෙහි තබා ගත යුතුය. පළමුවන ප්‍රශ්නයට ලකුණු (10 x 2) 20 කි. 02 සිට 06 දක්වා ප්‍රශ්නවල

i කොටසට ලකුණු 2 ක් ද, ii කොටසට ලකුණු 3 ක් ද, iii කොටසට ලකුණු 5 ක් ද වශයෙන් ලකුණු 10 බැගින් හිමිවේ. 7 වන ප්‍රශ්නයේ කොටසකට ලකුණු 05 බැගින් කොටස් දෙකට ලකුණු (5 x 2) 10 කි. ඒ අනුව II පත්‍රයට ලකුණු (20 + 10 x 4 ) 60 කි.

03. බුද්ධ චරිතය, ශ්‍රාවක ශ්‍රාවිකා චරිත, බෞද්ධ චරිත කථා, බෞද්ධ ධර්මය, බෞද්ධ සමාජය, බෞද්ධාගමික චාරිත්‍ර, බෞද්ධ රාජ්‍ය පාලන මූලධර්ම, බෞද්ධ සාහිත්‍ය හා කලාශිල්ප, බෞද්ධ ශාසන ඉතිහාසය, ලක්දිව බුදුසසුන ආදිය පිළිබඳ විෂය නිර්දේශයට අදාළ කරුණු සම්බන්ධ සාමාන්‍ය ඥානය, විශේෂ ඥානය හා ප්‍රායෝගික අවබෝධය පරීක්‍ෂා කර බැලීම මේ ප්‍රශ්න පත්‍රයෙන් බලාපොරොත්තු වනු ලැබේ.

දෙවන පත්‍රයේ අංක 1 ප්‍රශ්නය ඉදිරිපත් කොට ඇත්තේ බුද්ධ ධර්මය මූලික විෂය කරුණු කෙටියෙන් ලියා දැක්වීම සඳහා කෙටි ප්‍රශ්න 10 කින් සමන්විත ප්‍රශ්නයක් ලෙසය. එහි දී ශිෂ්‍යයාහට නම් කිරීමක්, අර්ථ දැක්වීමක්, කෙටියෙන් හැඳින්වීමක් වැනි ප්‍රජානන හැකියා ලියා ඉදිරිපත් කිරීමට සිදුවේ. හිමි ලකුණු 20 කි. අංක 2 සිට 6 දක්වා ප්‍රශ්නවල i කොටසින් විෂයට අදාළ මූලික කරුණු පිළිබඳ අපේක්‍ෂකයා සතු දැනුම පරීක්ෂාවට ලක්කෙරෙයි. ii කොටසින් ඒ හා සම්බන්ධ කරුණු විග්‍රහ කොට ඇති අයුරු අපේක්‍ෂකයා මනාව වටහාගෙන ඇත්දැයි විමසුමට ලක්කෙරේ. iii කොටසින් අදාළ විෂය සම්බන්ධයෙන් අපේක්ෂකයාගේ විචාරාත්මක අවබෝධය හා නිදහස් චින්තනය පරීක්ෂාවට ලක් කරනු ලැබේ.

මෙම කොටස් තුනෙන් iii කොටසට සපයා ඇති පිළිතුරු බොහෝවිට ගැඹුරු නොවීමට පුළුවන. එහෙත් අසා ඇති ප්‍රශ්න නිවැරදිව වටහා ගෙන අර්ථවත් කරුණු ඉදිරිපත් කර තිබේ නම් පිළිතුර කෙටි වුව ද සාධාරණ ලකුණු ප්‍රමාණයක් දීම සුදුසුය.

7 වන ප්‍රශ්නයේ මාතෘකා දෙකකට කෙටි සටහන් ලිවීම අපේක්ෂා කෙරේ.

04. ශිෂ්‍යයා නිවහල් චින්තනයට යොමු කිරීම නූතන අධ්‍යාපන ක්‍රියාවලියේ ප්‍රධාන පරමාර්ථය ලෙස සලකනු ලැබේ. එබැවින් බුද්ධ ධර්මය II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමේදී අදාළ පාඨ ග්‍රන්ථයන්හි අන්තර්ගතයට ම වහල් නොවී ස්වාධීනව ඉදිරිපත් කර ඇති නිවැරදි කරුණු පිළිබඳ ඔබේ අවධානය යොමු කිරීම මැනවි.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (සා.පෙළ) විභාගය 2024 (2025)

## විෂය: බුද්ධ ධර්මය

## විෂය අංකය: 11

## I පත්‍රය ඉගෙනුම් ඵල

1. සිදුහත් බෝසත් හා බුදු සිරිතට අදාළ වන සුවිශේෂී කරුණු, සිද්ධි, අවස්ථා හා ස්ථාන නම් කරයි.
2. සිදුහත් බෝධිසත්ව හා බුද්ධ චරිතයන්හි සුවිශේෂී ගුණාංග හා ආදර්ශයන් පැහැදිලි කර, පුද්ගල ජීවිතයට ඒවායේ ඇති ප්‍රායෝගිකත්වය අගයයි.
3. බුද්ධ බෝධිසත්ව චරිතයන්හි සහ බෞද්ධ ශ්‍රාවක ශ්‍රාවිකා චරිතයන්හි ඇති ශ්‍රේෂ්ඨ ගුණාංග චරිතායනය කරයි.
4. නිර්දිෂ්ට ග්‍රන්ථයන්හි සඳහන් බුදු සිරිතට හා බුදු දහමට අදළ ශ්‍රේෂ්ඨ ජීවන චරිත කථා ආශ්‍රයෙන් තම ජීවිතය අර්ථවත් කර ගැනීමට සහ එම චරිත කථාවන්හි ඇතුළත් ජීවිතාදර්ශ ආදර්ශනය කිරීමට සිතයි.
5. සමතිස් පාරමිතා ධර්ම අර්ථ සීමනය කර සිදුහත් බෝසතුන් පාරමිතා ධර්ම පූරණය කළ ආකාරය පහදමින් එම අවස්ථාවන්ට නිදසුන් සපයයි.
6. දස පාරමිතා ධර්මවල උගන්වන ජාතක කථාවලින් ලබා දෙන ජීවිතාදර්ශ තම ජීවිත සාර්ථක කර ගැනීමට අදාළ කර ගනියි.
7. බුදු දහමේ උගන්වන දස පුණ්‍යක්‍රියා හඳුනාගෙන ඒවා අනුගමනය කිරීමෙන් තම ජීවිතය සාර්ථක කර ගනියි.
8. ජාතික, ආගමික, සංස්කෘතික හා භාෂාත්මක විවිධත්වයක් සහිත ශ්‍රී ලාංකික ජන සමාජයේ සහයෝගයෙන් හා සහජීවනයෙන් ජීවත්වීමේ අගය පැහැදිලි කරයි.
9. බුදු දහමේ උගන්වන පංච නීවරණ ධර්මවල අර්ථය පැහැදිලි කර එය ශිෂ්‍යයාගේ ඉගෙනීමට බාධාකාරී වන ආකාරය පැහැදිලි කරයි.
10. කුසල් සිත් දියුණු කරන මානසික අභ්‍යාසයක් ලෙස බුදු දහමේ උගන්වන විවිධ භාවනා වර්ග හඳුනා ගෙන දෛනිකව පුරුදු පුහුණු කරයි.
11. ප්‍රධාන බෞද්ධ භාවනා ක්‍රම දෙක නම් කර එහි වෙනස්කම් පැහැදිලි කරයි.
12. බෞද්ධ අනුලෝම, ප්‍රතිලෝම පටිච්ච සමුප්පාද න්‍යාය පැහැදිලි කර එය ගැටලු විසඳා ගැනීමේ ක්‍රම පිළිවෙතක් ලෙස අදාළ කර ගනියි.
13. බුදු දහමේ උගන්වන චතුරාර්‍ය සත්‍යය, ආර්‍ය අෂ්ටාංගික මාර්ගය, නිර්වාණය,ත්‍රිලක්ෂණය ආදී මූලික සංකල්ප සහ අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂ ඥාන හෙවත් අභිඥා ධර්ම යනු මොනවාදැයි පැහැදිලි කරයි.
14. බෞද්ධ කර්ම සංකල්පය අර්ථසීමනය කර, කර්මය හා එහි ප්‍රභේද වෙන් වෙන් වශයෙන් විස්තර කරයි.
15. මනුෂ්‍ය වර්ගයාගේ ඒකීයත්වය පිළිබඳ බෞද්ධ විග්‍රහය අගයමින්, පුද්ගලයාගේ සිතීමට හා විමසීමට බුදු දමේ ලබා දී ඇති නිදහස ඇගයීමට ලක්කරයි.

16. පාඨ ග්‍රන්ථයන්හි සඳහන් මංගල, පරාභව, වසල, සිගාලෝවාද ආදී නිර්දිෂ්ට සූත්‍රාගත ධර්ම කරුණු දෛනික ජීවිතයේදී ප්‍රායෝගිකව ප්‍රයෝජනයට ගැනීම ගැන අවධානය යොමු කොට ක්‍රියාවට නංවයි.
17. බෞද්ධ පංචශීල ප්‍රතිපත්තිය පැහැදිලි කොට එම ප්‍රතිපත්තියෙහි පිහිටා කටයුතු කිරීමේ අවශ්‍යතාව එහි යහපත් ප්‍රතිඵල පෙන්වා දෙයි.
18. පාඨ ග්‍රන්ථයන්හි සඳහන් නිර්දිෂ්ට ධම්මපද ගාථා නිවැරදිව ලියා අර්ථ පහදයි. ධම්මපදය බෞද්ධයාගේ හස්තසාර ග්‍රන්ථය වන ආකාරය පහදමින් එහි සඳහන් සදුපදේශ දෛනික ජීවිතයට අදාළ කර ගනියි.
19. පරිසර සංරක්ෂණයේ ඇති වැදගත්කම බෞද්ධ ධර්මානුකූලව පැහැදිල කර එය නිවැරදි ආකාරයෙන් අනුගමනය කර සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගතකරයි.
20. බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති මූලධර්ම වන දස රාජ ධර්ම, දස සක්විතිවත්, සප්ත අපරිහානීය ධර්ම, පංචශීල ප්‍රතිපත්තිය,සතර සංග්‍රහ වස්තු, සිව් බඹ විහරණ, සතර අගතියෙන් තොරවීම යන ආදී කරුණු පැහැදිලි කරයි.
21. බුදු දහමේ උගන්වන සදාචාර මූලධර්ම පැහැදිලි කර ඒවා තම ජීවිත සාර්ථක කර ගැනීමට ඉවහල් කරගනියි.
22. ශාසන පරිහානී යුගවල බුදු දහම නගා සිටුවීමෙහිලා දේශ හිතෛෂී පිරිස් කටයුතු කළ ආකාරය ඇගයීමට ලක්කරයි.
23. ථේරවාදී බෞද්ධ ධර්ම සංගායනා සහ මාතලේ අලුවිහාර සංගායනාව පිළිබඳ තොරතුරු පැහැදිලි කර දක්වයි.
24. ඓතිහාසික මහින්දාගමනය සිදු වූ ආකාරය හා එහි ප්‍රතිඵල ශ්‍රී ලාංකික ජන ජීවිතය කෙරෙහි බලපෑ අකාරය පහදයි.
25. බෞද්ධ සාහිත්‍ය හඳුන්වා, බුදුදහම ඇසුරින් සිංහල සාහිත්‍ය පෝෂණය වූ ආකාරය පැහැදිලි කරයි.
26. පරිසරය හා පරිසර සංරක්ෂණයේ ඇති වැදගත්කම පිළිබඳ බෞද්ධ විග්‍රහය පැහැදිලි කරයි.
27. බෞද්ධ ඉගැන්වීම් අනුව නීරෝගී ජීවිතයක් ගතකිරීමේ ඇති වටිනාකම පැහැදිලි කරයි.
28. බෞද්ධ අනන්‍යතාව සුරකිමින් සහජීවනයෙන් කටයුතු කිරීමේ වැදගත්කම අගය කරයි.
29. බුද්ධ ප්‍රතිමා කලාවේ ආරම්භය හා විකාශය පැහැදිලි කර ශ්‍රී ලංකාවේ බුද්ධ ප්‍රතිමා නිර්මාණය හා එහි සුවිශේෂතාවන් ඇගයීමට ලක් කරයි.
30. ස්තූප කලාවේ සුවිශේෂීතාවන් පහදමින් ශ්‍රී ලංකාවේ ස්තූප නිර්මාණයේ සුවිශේෂී ගුණාංග පැහැදිලි කරයි.
31. ශ්‍රී ලංකාවේ බෞද්ධ මූර්ති කැටයම් කලාවේ විශේෂ ලක්ෂණ පැහදිලි කරයි.
32. ශ්‍රී ලංකාවේ බෞද්ධ චිත්‍ර කලාවේ සුවිශේෂ ලක්ෂණ පැහැදිලි කරයි.
33. බෞද්ධ කලා ශිලප ඇගයීමට ලක්කරමින් ඒවා ආරක්ෂා කර ගැනීමට කටයුතු කරයි.
34. පැරණි ශ්‍රී ලාංකික ශ්‍රී විභූතිය පිළිබඳ තොරතුරු සොයා බලමින් එය ඇගයීමට ලක් කරයි.
35. බුදු දහමේ උගන්වන මූලික ප්‍රතිපත්ති අනුව කටයුතු කරමින් සැදැහැති බෞද්ධයකු ලෙස දිවි ගෙවයි.
36. තෙරුවන සරණ යමින්, පංචශීල ප්‍රතිපත්තියෙහි පිහිටා දිවි ගෙවමින්, දෛනික වත් පිළිවෙත් අනුගමනය කරයි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

රහස්‍යයි

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2024 (2025)
## க.பொ.த. (சா.தர)ப் பரீட்சை - 2024 (2025)

විෂය අංකය / பாட இலக்கம்: **11**

විෂයය / பாடம்: **බුද්ධ ධර්මය**

### I පත්‍රය - පිළිතුරු
### I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 2 | 21. | 4 | 31. | 2 |
| 02. | 2 | 12. | 4 | 22. | 2 | 32. | 1 |
| 03. | 2 | 13. | 2 | 23. | 3 | 33. | 4 |
| 04. | 3 | 14. | 4 | 24. | 3 | 34. | 4 |
| 05. | 1 | 15. | 4 | 25. | 3 | 35. | 3 |
| 06. | 4 | 16. | 4 | 26. | 2 | 36. | 4 |
| 07. | 3 | 17. | 3 | 27. | 3 | 37. | 3 |
| 08. | 2 | 18. | 4 | 28. | 2 | 38. | 2 |
| 09. | 1 | 19. | 2 | 29. | 4 | 39. | 1 |
| 10. | 4 | 20. | 2 | 30. | 3 | 40. | 2 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: 25 / 40

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி: 25 / 40

## II - පත්‍රය ඉගෙනුම් ඵල

**01. ප්‍රශ්නය**

1. බුද්ධ චරිතයේ සුවිශේෂී අවස්ථා සිද්ධි හා ගුණාංග ගෙනහැර දක්වයි. සිදුහත් කුමරාගේ සුළු මවගේ නම ලියා දක්වයි.
2. වණ්ණුපථ ජාතක කථාවෙන් හෙළිවන සිදුහත් බෝසතාණන් වහන්සේ සම්පූර්ණ කළ පාරමිතාව පවසයි.
3. දුටුගැමුණු රජු ඉදිරිපත් කළ ආදර්ශ පාඨය පවසයි.
4. හේතුඵල දහම ගැන සඳහන් ගාථා පාඨයේ අදහස ලියා දක්වයි.
5. අනුලෝම පටිච්ච සමුප්පාද පාඨවල අර්ථ සරලව ලියා දක්වයි.
6. "ලාභෝ අලාභෝ අයසෝ යසෝ ච" ගාථාවෙන් කියැවෙන ධර්ම කරුණ නිවැරදිව ලියා දක්වයි.
7. පළමුවන හා දෙවන ධර්ම සංගායනා සඳහා අනුග්‍රහය ලබා දුන් පාලකයින් දෙදෙනාගේ නම් නිවැරදිව ලියා දක්වයි.
8. මනෝ කර්ම ගණයට වැටෙන අකුසල් නම්කරයි.
9. අමාවතුර ග්‍රන්ථය රචනා කළ කතුවරයාගේ නම ලියයි.
10. වැලිවිට සරණංකර සංඝරාජ මාහිමිපාණන් වහන්සේ විසින් රචිත ග්‍රන්ථ ලියා දක්වයි.

**02. ප්‍රශ්නය**

1. තාදී ගුණය ධර්මානුකූලව පැහැදිලි කරයි.
2. බුදු සිරිතෙන් තාදී ගුණය ප්‍රකට වූ අවස්ථාවන් පෙන්වා දෙයි.
3. ශිෂ්‍ය ජීවිතය සාර්ථකත්වයට පත්කර ගැනීමට තාදී ගුණය ඉවහල් කර ගත හැකි ආකාරය විස්තර කරයි.

**03. ප්‍රශ්නය**

1. චාරිත්‍ර හා වාරිත්‍ර (සිරිත් විරිත්) යන වචන ධර්මානුකූලව පැහැදිලි කරයි.
2. සිල් රැකීමෙන් ලැබෙන ආනිසංස ගෙනහැර දක්වයි.
3. සිල්වත්වීම පුද්ගල සංවර්ධනයට මෙන්ම සමාජ සංවර්ධනයට ඉවහල් වන ආකාරය පැහැදිලි කරයි.

**04. ප්‍රශ්නය**

1. දී ඇති නිර්දිෂ්ට ධම්මපද ගාථාව නිවැරදිව ලියා දක්වයි.
2. අදාළ ධම්මපද ගාථාවෙහි අර්ථය නිවැරදිව ලියයි.
3. දස කුසල් වැඩීම තුළින් පුද්ගල ජීවිත සාර්ථක කර ගත හැකි ආකාරය පහදයි.

**05. ප්‍රශ්නය**

1. චතුරාර්ය සත්‍ය නම්කරයි.
2. එක් එක් මාර්ග අංගය ධර්මානුකූලව පැහැදිලි කරයි.
3. ගැටලු තේරුම් ගෙන විසඳා ගැනීමේ මාර්ගය ලෙස චතුරාර්ය සත්‍ය ධර්මයේ ඇති වටිනාකම ඇගයීමට ලක්කරයි.

**06. ප්‍රශ්නය**

1. සතර අගති නම්කරයි.
2. එක් එක් අගතිය ධර්මානුකූලව පැහැදිලි කරයි.
3. දේශපාලන ප්‍රතිපත්තියක් ලෙස සතර අගතිවලින් වැලකීමේ ඇති වටිනාකම අැගයීමට ලක්කරයි.

**07. ප්‍රශ්නය**

1. අනගාරික ධර්මපාලතුමාගේ චරිතාපදානයේ වැදගත් සිද්ධි, ශාසනික සේවාවන් හා උදාර ගුණාංග ගෙනහැර දක්වා එකී චරිතයෙන් ගතහැකි ආදර්ශ චරිතායනය කරයි.
2. දුමින්දාගමනය පිළිබඳ විස්තරයක් සපයයි.
3. විචිකිච්ඡා නීවරණය ධර්මානුකූලව පැහැදිලි කරයි.
4. වටදාගෙය පිළිබඳ විස්තර ගෙනහැර දක්වයි.

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2024 (2025)

# 11 - බුද්ධ ධර්මය

## II පත්‍රය

1. (i) සිදුහත් කුමරුගේ සුළු මවගේ නම කුමක් ද?
(ii) වණ්ණුපථ ජාතක කථාවෙන් හෙළිවන්නේ සිදුහත් බෝසතාණන් සම්පූර්ණ කළ කවර පාරමිතාව ද?
(iii) "මාගේ මේ ව්‍යායාමය හුදෙක් රජ සැප පිණිස නොව සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහාමය" යන ආදර්ශ පාඨය පෙරදැරි කරගෙන කටයුතු කළ රාජ්‍ය පාලකයාගේ නම කුමක් ද?
(iv) "යේ ධම්මා හේතුප්පභවා - තේසං හේතුං තථාගතෝ ආහ" මෙම පාඨයේ තේරුම ලියන්න.
(v) "තණ්හා පච්චයා උපාදානං" යන්නෙහි අර්ථය දක්වන්න.
(vi) "ලාභෝ අලාභෝ අයසෝ යසෝ ච" යන ගාථාවෙන් අදහස් වන්නේ කිනම් ධර්ම කරුණක් පිළිබඳව ද?
(vii) පළමුවන හා දෙවන ධර්ම සංගායනා සඳහා අනුග්‍රහය ලබා දුන් පාලකයින් **දෙදෙනාගේ** නම් ලියන්න.
(viii) 'මනෝකම්ම' ගණයට වැටෙන අකුසල් අතුරෙන් **දෙකක්** නම් කරන්න.
(ix) 'අමාවතුර' රචනා කළ කතුවරයාගේ නම ලියන්න.
(x) වැලිවිට සරණංකර සංඝරාජ මාහිමිපාණන් විසින් රචනා කරනු ලැබූ ග්‍රන්ථ **දෙකක්** නම් කරන්න.

**(i)** මහා ප්‍රජාපතී ගෝතමී / ප්‍රජාපතී ගෝතමී

*(ලකුණු 02යි)*

**(ii)** වීර්ය පාරමිතාව / විරිය පාරමිතා /වීර්ය /විරිය

*(ලකුණු 02යි)*

**(iii)** දුටුගැමුණු මහ රජතුමා / ගැමුණු රජතුමා / දුටුගැමුණු / දුට්ඨ ගාමිණී අභය රජතුමා

***නිවැරදිව නම්කර ඇත්නම් ලකුණු දෙක ලබා දෙන්න.***

*(ලකුණු 02යි)*

**(iv)** හේතුවෙන් උපදින යම් ධර්ම කෙනෙක් වෙත්ද, ඒ ධර්මයන්ගේ හේතුව තථාගතයන් වහන්සේ වදාළ සේක. / හේතුවෙන් හටගන්නා ධර්මයන්ගේ හේතුව බුදුරජාණන් වහන්සේ දේශනා කොට ඇත./ ධර්මයන්ගේ හටගැනීමේ හේතුව බුදුරජාණන් වහන්සේ දේශනා කොට ඇත.

***මේ අදහස ඇති පිළිතුරකට ලකුණු ලබා දෙන්න.***

*(ලකුණු 02යි)*

**(v)** තණ්හාව නිසා සිතින් දැඩිව අල්ලා ගැනීම වේ. / තෘෂ්ණාව නිසා අල්ලා ගැනීම වේ / තෘෂ්ණාව නිසා උපාදානය වේ.

*(ලකුණු 02යි)*

**(vi)** අට ලෝ දහම / අෂ්ට ලෝක ධර්මය

***නිවැරදි නම් කිරීමට ලකුණු දෙකයි.*** *(ලකුණු 02යි)*

**(vii)** **පළමුවන ධර්ම සංගායනාව :** අජාසත් රජතුමා/අජාසත්ත රජු/අජාසත්/අජාතශත්‍රැ
**පළමුවන ධර්ම සංගායනාව :** කාලාශෝක රජතුමා/කාලාශෝක

***නිවැරදි නම් කිරීමකට ලකුණ බැගින් ලකුණු 2 දෙන්න.***

*(ලකුණු 02යි)*

**(viii)**

- අභිධ්‍යාව / දැඩි ලෝභය / මසුරු බව
- ව්‍යාපාදය / තරහව
- මිත්‍යාදෘෂ්ටිය / වැරදි දැකීම

***කරුණකට 1 ලකුණ බැගින් ලකුණු 2ක් දෙන්න.***

***(ලකුණු 02යි)***

**(ix)** ගුරුළුගෝමී පඬිතුමා / ගුරුළුගෝමී ***(ලකුණු 02යි)***

**(x)** 1. මුණිගුණාලංකාරය
2. සාරාර්ථ සංග්‍රහය
3. රතනත්‍රය ප්‍රණාම ගාථා සන්නය
4. සතර බණවර සන්නය

***එක් නම් කිරීමකට එක බැගින් ලකුණු 2ක් දෙන්න.***

***(ලකුණු 02යි)***

| |
|---|
| **2.** (i) 'තාදී ගුණය' ධර්මානුකූලව විවරණය කරන්න. |

අට ලෝ දහම්හි කම්පා නොවී සිටීමේ ගුණයයි. ලාභ අලාභ, අයස යස, නින්දා ප්‍රශංසා, සුඛ දුක්ඛ යන අෂ්ට ලෝක ධර්ම විෂයෙහි අකම්ප්‍යව සිටීමේ ගුණයයි.

***කෙටි පැහැදිලි කිරීමක් වේ නම් ලකුණු දෙක දෙන්න. (ලකුණු 02යි)***

| |
|---|
| (ii) 'තාදී ගුණය' බුද්ධ චරිතයෙන් ප්‍රකට වූ අවස්ථා **තුනකට** නිදසුන් දක්වන්න. |

- කොසොල් මහරජතුමාගේ අසදෘශ මහා දානය මැදහත් සිතින් පිළිගැනීම
- අනේපිඬු සිටුතුමාගේ ජේතවනාරාම පූජාව මැදහත් සිතින් පිළිගැනීම
- විශාඛා මහා උපාසිකාවගේ පූර්වාරාම පූජාව ආදී අවස්ථාවන්හිදී උද්දාමයට පත් නොවී සිටීම.
- කෝසල, බිම්බිසාර, ලිච්ඡවී වැනි රාජානුග්‍රහය ලැබීම් ආදියේදී මධ්‍යස්ථවීම
- සෝණදණ්ඩ, චංකී, පොට්ඨපාද වැනි බමුණු, පිරිවැජියන්ගේ ප්‍රසංසා ආදියෙහි මධ්‍යස්ථව සිටීම
- අනේපිඬු, විශාඛා, බන්දුල මල්ලිකා ආදීන්ගේ අනුග්‍රහ, ප්‍රශංසා ලැබීමේදී මධ්‍යස්ථව සිටීම
- උදය බමුණාගේ ආරාධනයෙන් වේරංජාවේ වස්වසා, එම කාලයේදී යව නමැති කටුක ආහාර වැළඳීම
- සුප්‍රිය පරිබ්‍රාජකයා තෙරුවනෙහි අගුණ දොස්කීමද, ඔහුගේ අත වැසි බ්‍රහ්මදත්ත තෙරුවනට ප්‍රසංසා කිරීම ද යන අවස්ථා දෙකෙහිම මධ්‍යස්ථව සිටීමට උපදෙස් දීම
- සුන්දරී පරිබ්‍රාජිකාව යොදා ගනිමින් බුදුරජාණන් වහන්සේ අපහාසයට, අපකීර්තියට පත් කිරීමට උත්සාහ ගත් අවස්ථාවේදී මධ්‍යස්ථව දාරා සිටීම
- මාගන්දියාගේ නින්දා අපහාස ඉවසීම
- චිංචාමානවිකාවගේ නින්දා අපහාස ඉවසීම
- අක්කෝසභාරද්වාජ බමුණාගේ අපවාදවලට මුහුණදීම
- කසීභාරද්වාජ වැනි බමුණන්ගේ අපවාදවලට මුහුණදීම

***ආදී අට ලෝ දහමින් කම්පා නොවී සිටීමට අදාළ අවස්ථා තුනක් දක්වා තිබේ නම් ලකුණු තුන ලබා දෙන්න. (ලකුණු 03යි)***

| |
|---|
| (iii) ශිෂ්‍ය ජීවිතය සාර්ථකත්වයට පත්කර ගැනීම සඳහා 'තාදී ගුණය' අදාළ කරගත හැකි ආකාරය පැහැදිලි කරන්න. |

- ශිෂ්‍ය ජීවිතය සාර්ථකත්වයට පත්කර ගැනීම සඳහා තාදී ගුණය අදාළ කර ගත හැකිය.
- ලාභ අලාභ, අයස යස, නින්දා ප්‍රශංසා, සුඛ දුක්ඛ යන මේවා පොදු ධර්මතාවන් නිසා ඒවා සමසේ විඳ දරා ගැනීමේ මානසික ශක්තිය ගොඩ නගා ගැනීමට ශිෂ්‍යයින්ට හැකි විය යුතුය.
- තරග, විභාග ආදිය පරාජය වීමෙන් හඬා වැලපී කම්පාවට පත්වීම හෝ ඒවා ජයග්‍රහනය කිරීමෙන් උද්දාමයට පත්වීම හෝ නොව ඒවා සම සිතින් විඳ දරා ගැනීමට පුරුදු පුහුණු විය යුතුය.
- නින්දා අපහාසවලදී දුර්මුඛ වී හඬා වැලපීම, ක්ෂණික තීරණ ගැනීම ද, ප්‍රසංසා ලැබුනු විට ඉන් උද්දාමයට පත්ව ක්‍රියා කිරීම ද අනුවණකමක් ලෙස සැලකිය යුතුය.
- සැප දුක් දෙකෙහිදීම නොසැලී සිටීමට පුරුදු විය යුතුය.
- බුදුරජාණන් වහන්සේටද අට ලෝ දහමට මුහුණ පෑමට සිදු වූ ආකාරය සිහි කරමින් ශිෂ්‍ය ජීවිත් සාර්ථකත්වයට පත් කර ගත හැකිය.

***පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න. (ලකුණු 05යි)***

| |
|---|
| 3. (i) 'චාරිත්‍ර වාරිත්‍ර' (සිරිත් විරිත්) යන වචන ධර්මානුකූලව අර්ථ දක්වන්න. |

<u>**චාරිත්‍ර වාරිත්‍ර - සිරිත් විරිත්**</u>

- චාරිත්‍ර හෙවත් සිරිත් යනු කළ යුතු දේ යි. මේවා සමාදාන නමින් ද හැඳින්වේ. සතුන්ට කරුණාව මෛත්‍රිය දැක්වීම ආදී කළ යුතු ක්‍රියාවන් කිරීම චාරිත්‍ර ලෙස දැක්වේ.
- වාරිත්‍ර හෙවත් විරිත් යනු වැලකිය යුතු, නොකළ යුතු දේයි. මේවා විරමණ ලෙස ද හැඳින්වේ. සතුන් මැරීම සොරකම් කිරීම ආදී නොකළ යුතු ක්‍රියාවන්ගෙන් වැලකී සිටීමයි.

***කෙටි පැහැදිලි කිරීමකට එක් ලකුණ බැගින් ලකුණු 2 දෙන්න. (ලකුණු 02යි)***

| |
|---|
| 3. (ii) සිල් රැකීමෙන් ලැබෙන ආනිසංස පහෙන් **තුනක්** ලියා දක්වන්න. |

1. මහත් වූ භෝග සම්පත් අත්පත් කර ගැනීම / භෝග සම්පත් ලැබීම
2. කීර්තිය පැතිරීම /කිතු ගොස පැතිරීම
3. ඕනෑම පිරිසක් මැදට නිර්භයව එළඹීමට හැකිවීම / නිර්භයව පිරිසක් වෙත යා හැකිවීම
4. සිහි මුලා නොවී කලුරිය කිරීම / මනා සිහියෙන් මිය යාම
5. මරණින් මතු සුගතියෙහි උපත ලැබීම / සුගතියේ (දෙව්ලොව) ඉපදීම

***කරුණු තුනක් නිවැරදිව ලියා තිබේනම් ලකුණු 3 දෙන්න. (ලකුණු 03යි)***

| |
|---|
| (iii) සිල්වත් වීම පුද්ගල සංවර්ධනයට මෙන්ම සමාජ සංවර්ධනයට ද ඉවහල් වන ආකාරය පහදන්න. |

- සිල්වත්වීම පුද්ගල සංවර්ධනයට මෙන්ම සමාජ සංවර්ධනයට ඉවහල් වේ.
- සිල්වත් ජීවිතයක් ගතකරන පුද්ගලයා උද්‍යෝගීව අප්‍රමාදීව කටයුතු කරයි.
- පස් පව් ආදියෙන් වැලකී ක්‍රියා කරන සිල්වත් පුද්ගලයාගේ කීර්තිය දසත පැතිරේ.
- සිල් සුවඳ අනෙක් සුවඳ වර්ග අභිභවා පැතිරේ.
- සිල්වතා යමක් කිරීමට පෙර එහි යහපත් අයහපත් ප්‍රතිඵල පිළිබඳ විමසිලිවත් වෙයි.
- සමාජ සිරිත් විරිත් සාරධර්ම ආදියට ගරු කරයි.

- පඤ්ච ශීලය ආරක්ෂා කරන තැනැත්තා අන් අයගේ අයිතිවාසිකම් සුරක්ෂිත කර දේ.
- ඔහු සමාජය ප්‍රිය කරන, විශ්වාසවන්ත, සාමකාමී, සුහද පුද්ගලයෙකි.
- එක් එක් පුද්ගලයා තනි තනිව සිල්වත්වීම මගින්, පුද්ගල සංවර්ධනය ඇති වන අතර සමාජ සංවර්ධනයද ඇතිවේ.

***පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න. (ලකුණු 05යි)***

**4. (i) "තං ච කම්මං කතං සාධු" යන ධම්මපද ගාථාව සම්පූර්ණ කර ලියන්න.**

තං ච කම්මං කතං සාධු
යං කත්වා නානුතප්පති
යස්ස පතීතෝ සුමනෝ
විපාකං පටිසේවති

***ගාථාව සම්පූර්ණයෙන් ලියා ඇත්නම් ලකුණු 02 ප්‍රදානය කරන්න.***
***අක්ෂර වින්‍යාසය නොසලකන්න. (ලකුණු 02යි.)***

**(ii) ඉහත (i) ගාථාවේ අදහස ලියන්න.**

යම් ක්‍රියාවක් කිරීමෙන් පසුතැවෙන්නට සිදු නොවේද, යම් ක්‍රියාවක විපාකය ප්‍රීතියෙන් හා සොම්නසින් යුතුව විඳිය හැකිවේද, එබඳු ක්‍රියාවල නිරත විය යුතුය. /
පසු තැවීමට හේතු නොවන, විපාකය සතුටින් විඳිය හැකි ක්‍රියා කිරීම මැනවි.

***ගාථාවේ සම්පූර්ණ අදහස තිබේනම් ලකුණු 03 ලබා දෙන්න. (ලකුණු 03 යි.)***

**(iii) දස කුසල් වැඩීම තුළින් සාර්ථක පුද්ගලයකු විය හැකි ආකාරය පැහැදිලි කරන්න.**

- දස කුසල් වැඩීම පුද්ගල ජීවිතය සාර්ථක කර ගැනීමට ඉවහල් වේ.
- සිත කය වචනය තිදොරින් සිදු කරන අකුසලයන්ගෙන් වැලකී කුසල්හි නිරත විය යුතුය.
- අලෝභ, අදෝස, අමෝහ යන කුසල මූලයන් පෙරදැරි කරගෙන සිදුකරන යහපත් ක්‍රියා කුසල ලෙස සැලකේ.
- ප්‍රාණඝාත ආදී කයෙන් සිදුවන අකුසල කර්ම 3න් ද, මුසාවාද ආදී වචනයෙන් සිදුවන වැරදි 4න් ද, අභිධ්‍යා ආදී මනසින් සිදුවන අකුසල කර්ම 3න් ද වැලකීම දස කුසල් වැඩීම නම් වේ.
- කුසල් දහම්හි යෙදීමෙන් මෙලොව පරලොව දෙලොව යහපත උදාකරගත හැකි ආකාරයත්, අකුසල වශයෙන් සැලකෙන පාපී වැරදි ක්‍රියාවන්ගෙන් වෙන්ව තමාටත් අනුන්ටත් යහපත පිණිස පවතින කුසල් දහම්හි යෙදීමත් තුළින් තම ජීවිත සඵල කරගත හැකි වේ.
- මෙම කුසල් වැඩීමෙන් ජීවිත සුරක්ෂිතතාව, දේපළ සුරක්ෂිතතාව, අන්‍යෝන්‍ය ගෞරවය හා විශ්වාසය, සත්‍යවාදී බව, වචනයේ විශ්වසනීයත්වය හා මානසිකසුවතාව ආදී බොහෝ ප්‍රතිඵල හරහා පුද්ගල ජීවිතය සාර්ථක කර ගත හැකිය.

***දස අකුසල්වලින් වැලකී සිටීම පදනම් කරගෙන ලියූ පිළිතුරකට සම්පූර්ණ ලකුණු දෙන්න.***
***පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න. (ලකුණු 05යි.)***

**5. (i) චතුරාර්ය සත්‍ය ධර්මවලින් දෙකක් නම් කරන්න.**

1. දුක්ඛ ආර්ය සත්‍යය / දුක පිළිබඳ උතුම් සත්‍යය / දුක්ඛ සත්‍යය / දුක
2. දුක්ඛ සමුදය ආර්ය සත්‍යය / දුක හට ගැනීමට හේතුව පිළිබඳ උතුම් සත්‍යය/ දුකට හේතුව/ සමුදය
3. දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය / දුක නැති කිරීම පිළිබඳ උතුම් සත්‍යය / දුක නැති කිරීම / නිරෝධ
4. දුක්ඛ නිරෝධ ගාමිනී පටිපදා ආර්ය සත්‍යය / දුක නැති කිරීමේ මාර්ගය පිළිබඳ උතුම් සත්‍යය / දුක නැති කිරීමේ මග / මාර්ග

***නිවැරදිව දෙකක් නම් කර ඇත්නම් ලකුණු දෙක දෙන්න. (ලකුණු 02යි)***

**(ii) ඉහත (i) හි නම් කළ එක් සත්‍යයක් කෙටියෙන් විස්තර කරන්න.**

1. <u>දුක්ඛ ආර්ය සත්‍යය</u>
   - ඉපදීම (ජාති) වයසට යාම (ජරා) ලෙඩවීම (ව්‍යාධි) මරණය, ප්‍රියයන්ගෙන් වෙන්වීම, අප්‍රියයන් හා එක්වීම, කැමති දේ නොලැබීම දුකයි. කෙටියෙන් කියතොත් පංච උපාදානස්කන්ධයම දුකය.

2. <u>දුක්ඛ සමුදය ආර්ය සත්‍යය</u>
   - පුනර්භවය ඇති කරන, ඇල්ම හා සතුට සහිත වූ ඒ ඒ තැන සිත අලවන තෘෂ්ණාව (තණ්හාව) දුකට හේතුවයි. කාම, භව, විභව යන ත්‍රිවිධ තෘෂ්ණාවයි.
   - සසර නැවත නැවත ඉපදීමට හේතුවන තෘෂ්ණාවයි.

3. <u>දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය</u>
   - සසර දුක ඇති කරන එකී තෘෂ්ණාව ඉතිරි නොවන ලෙස නැති කිරීම, නොඇලීම හෙවත් විරාගය, නිරෝධය, සියලු ආශාවන් අත්හැරීම, සියලු දෙයින් නිදහස්වීම, මිදීම, ආලය දුරු කිරීම දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යයයි.
   - සසර නැවත නැවත ඉපදීමට හේතුවන තෘෂ්ණාව සම්පූර්ණයෙන් නැතිකර දැමීමයි.

4. <u>දුක්ඛ නිරෝධ ගාමිනී පටිපදා ආර්ය සත්‍යය</u>
   - දුකින් මිදීමේ මගයි. එනම් අංග අටකින් යුත් ආර්ය මාර්ගයයි. මධ්‍යම ප්‍රතිපදාවයි. සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන මාර්ග අංග අට වැඩීමයි.

***මූලික අර්ථය ඇතුළත් කෙටි පැහැදිලි කිරීමකට සම්පූර්ණ ලකුණු දෙන්න. (ලකුණු 03 යි.)***

**(iii) ගැටලු තේරුම්ගෙන විසඳා ගැනීමේ හොඳම මග චතුරාර්ය සත්‍ය බව පැහැදිලි කරන්න.**

- ගැටලු තේරුම් ගෙන විසඳා ගැනීමේ හොඳම මාර්ගය චතුරාර්ය සත්‍යයයි.
- බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ චතුරාර්ය සත්‍ය දේශනා මාර්ගය ලෝකෝත්තර විමුක්ති මාර්ගය ලෙස පමණක් නොව, ලෞකික ජීවිතයේ අප මුහුණ දෙන විවිධාකාර ගැටලු හා ඒවා විසඳා ගැනීමේ මාර්ගය ලෙස ද ගත හැකිය.
- පළමුවෙන්ම අප හමුවේ ඇති ගැටලුව මැනෙවින් තේරුම් ගත යුතුය.
- දෙවනුව එම ගැටලුව සඳහා තුඩු දී ඇති හේතු මොනවාදැයි අනාවරණය කර ගත යුතුය.
- තුන්වෙනුව එකී ගැටලුව සඳහා ඇති විසඳුම් අතුරෙන් සුදුසුම විසඳුම කුමක්දැයි අවබෝධ කර ගත යුතුය.
- සිව්වෙනුව ගැටලුව විසඳා ගැනීමේ මාර්ගය කුමක්දැයි තේරුම් ගෙන ඒ මාර්ගයේ ගමන් කළ යුතුය.
- මේ පියවර හතර මනාව වටහා ගෙන අනුගමනය කිරීමෙන් පුද්ගල ගැටලු විසඳා ගත හැකි වේ.
- මෙය අපගේ ප්‍රායෝගික ජීවිතයේදී ද අදාළ කර ගත හැකි ක්‍රියා මාර්ගයකි.

**පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න. (ලකුණු 05 යි.)**

**6. (i) සතර අගතිවලට අයත් කරුණු දෙකක් ලියන්න.**

ඡන්දා / ඡන්දය / කැමැත්ත

දෝසා / ද්වේශය / තරහ

භයා / භය / බිය

මෝහා / මෝහය / මුලාව

***නිවැරදිව දෙකක් නම් කර ඇත්නම් ලකුණු දෙක දෙන්න. (ලකුණු 02යි)***

**(ii) ඉහත (i) හි සඳහන් එක් කරුණක් කෙටියෙන් පැහැදිලි කරන්න.**

**ඡන්දය**

- ඡන්දය යනු කැමැත්තයි. තමන්ගේකම, නෑදෑකම, හිතවත්කම, පාක්ෂිකත්වය ආදිය නිසා අයුතු වැඩ කිරීමයි. පෞද්ගලික රුචි අරුචිකම් මත අගතිගාමී වීමයි.

**ද්වේශය**

- තමන්ගේ නොවන, තමන්ට විරුද්ධ, තම පක්ෂයේ නොවන අයට තරහයෙන්, වෛරයෙන් යුතුව කටයුතු කිරීම, අසාධාරණකම් කිරීම ද්වේශයෙන් අගතිගාමී වීමයි.

**භය**

- යම් පුද්ගලයකුට, යම් සංවිධානයකට බියෙන් අගතිගාමී වීමයි. බිය නිසා ජනතාවට අහිතකර තීරණවලට එළඹිය හැකිය.

**මෝහය**

- යුක්තිය අයුක්තිය, හොඳ නරක තෝරා බේරා ගැනීමට නොහැකියාව මෝහයයි.

***මූලික අර්ථය ඇතුළත් කෙටි පැහැදිලි කිරීමකට සම්පූර්ණ ලකුණු දෙන්න. (ලකුණු 03 යි.)***

**(iii) පරමාදර්ශී පාලන තන්ත්‍රයක් උදෙසා සතර අගතියෙන් තොරවීමේ වැදගත්කම ඇගයීමට ලක් කරන්න.**

- පුද්ගලයකු අගතිගාමී බවට පත් කිරීමට ඉවහල්වන දුර්ගුණ හතරක් මින් විස්තර වේ.
- පරමාදර්ශී පාලන තන්ත්‍රයක් උදෙසා දේශනා කොට ඇති ධර්ම කරුණු අතර සතර අගතියෙන් වැලකී කටයුතු කිරීම ද වැදගත් කොට සැලකේ.
- දේශපාලන ප්‍රතිපත්තියක් ලෙස එය පාලකයින්හට මග පෙන්වන්නකි.
- අගතිය යනු නීතියට, යුක්තියට, ධර්මයට පටහැනිව ක්‍රියා කිරීමයි.
- රාජ්‍ය පාලකයකු රාජ්‍ය පාලනයේදී ඡන්දය ද්වේශය ආදී දුර්ගුණ වලින් වැලකී අගතියකින් තොරව මධ්‍යස්ථව තම රට වැසියන්ට සේවය කළ යුතුය.
- සතර අගතියෙන් තොර වූ කල්හි සමස්ත රට වැසියන්ට සමානාත්මතාවයෙන් සලකන, මානව අයිතිවාසිකම් ආරක්ෂාවන, නීතියට යුක්තියට ගරුකරන, ජනහිතකාමී, සර්ව සාධාරණ, සාමකාමී, පරමාදර්ශී පාලන තන්ත්‍රයක් ගොඩ නගා ගත හැකිය.

***පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න. (ලකුණු 05 යි.)***

**7. පහත සඳහන් මාතෘකා අතුරෙන් දෙකකට කෙටි සටහන් ලියන්න.**
(i) අනගාරික ධර්මපාලතුමා.
(ii) දුමින්දාගමනය.
(iii) විචිකිච්ඡා නීවරණය.
(iv) වටදාගෙය.

**(i) <u>අනගාරික ධර්මපාල තුමා</u>**

1864 සැප්තැම්බර් මස 17 වන දින උපත ලත් දොන් ඩේවිඩ් හේවාවිතාරණ කුමරු මිෂනාරී පාසල් අධ්‍යාපනය ලැබීය. තම දෙමාපියන් සමග විහාරස්ථානවලට ගොස් භික්ෂූන් වහන්සේලාගේ ඇසුර ලැබීය. ශ්‍රී ලංකාවට පැමිණි සර් හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා සමග රට තුළ සංචාරය කළ මෙතුමා ඕල්කට් තුමා ඉංග්‍රීසියෙන් කළ දේශන සිංහලට පරිවර්තනය කළේය. ඩේවිඩ් යන නම බැහැර ලූ මොහු අනගාරික ධර්මපාල යන නම භාවිත කළේය. මිෂනාරී අධ්‍යාපනය වෙනුවට බෞද්ධ අධ්‍යාපනය නගා සිටුවීම සඳහා විශාල මෙහෙයක් ඉටු කළේය. පරම විඥානාර්ථ බෞද්ධ සමාගම මගින් සිංහල දරුවන්ට බෞද්ධ අධ්‍යාපනයක් ලබා දීමට වෙහෙසී කටයුතු කළේය.

මෙතුමා ඉන්දියාවට ගොස් හින්දූන් අත්පත් කරගෙන තිබූ බුද්ධගයාව ඇතුළු බෞද්ධ සිද්ධස්ථාන බේරා ගැනීමට විශාල කාර්යභාරයක් ඉටු කළේය. එංගලන්තයේ ලන්ඩන් බෞද්ධ මධ්‍යස්ථානය, බරණැස මූලගන්ධකුටි විහාරය, කල්කටාවේ ධර්මරාජික විහාරය, බුද්ධගයාවේ හා මදුරාසියේ බෞද්ධ විශ්‍රාම ශාලා ආදිය ඉදි කළේය. විශාල ශාසනික මෙහෙයක් ඉටුකළ මෙතුමා පසුව සිරි දේවමිත්ත නමින් පැවිදිව උපසම්පදාව ලැබීය. 1933 අප්‍රේල් මස 29 වන දින අපවත් විය. සිංහල බෞද්ධයින් අවදි කරලීමට, දහම් අධ්‍යාපනය නගා සිටුවීමට මෙන්ම සම්බුද්ධ ශාසනය පුබුදුවාලීමට ද අතිවිශාල මෙහෙයක් මෙතුමාගෙන් ඉටුවිය.

***පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න. (ලකුණු 05යි.)***

**(ii) දුමින්දාගමනය**

දුමින්දාගමනය යනුවෙන් හැඳින්වෙන්නේ දඹදිව බුද්ධගයාවේ වැඩ සිටි ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව ශ්‍රී ලංකාද්වීපයට වැඩම කරවීමයි. සංඝමිත්තා මහරහත් මෙහෙණින් වහන්සේ එහිලා ප්‍රමුඛත්වය ගත්හ.

මිහිඳු මහ රහතන් වහන්සේගේ හා දෙවානම්පියතිස්ස රජතුමාගේ ආරාධනය අනුව සංඝමිත්තා රහත් මෙහෙණින් වහන්සේ ලක්දිවට වැඩම කළහ. රහත් මෙහෙණිය විසින් වැඩම කරනු ලැබූ ශ්‍රී මහා බෝධි ශාඛාව දෙවන පෑ තිස් මහ රජතුමා පුද සිරිත් සහිත විසිතුරු පෙරහැරක් පවත්වා පිළිගෙන අනුරාධපුරයට වැඩම කරවා මහමෙවුනා උයනෙහි රෝපණය කළේය. බෝධීන් වහන්සේගේ ආරක්ෂාව සඳහා අටළොස් කුලයක ජනයාද ලක්දිවට පැමිණි බව සඳහන් වේ.

**කෙටි පැහැදිලි කිරීමකට සම්පූර්ණ ලකුණු දෙන්න. (ලකුණු 05යි.)**

**(iii) විචිකිච්ඡා නීවරණය**

නීවරණ ධර්ම අතර පස්වැන්න විචිකිච්ඡාවයි. විචිකිච්ඡාව යනු සැකයයි. බුදුන්, දහම්, සඟුන්, පෙර අපර භව, ත්‍රිශික්ෂාව ආදී අට තැන්හි සැක කිරීම විචිකිච්ඡාවයි. එක් කරුණක් ගැන වරක් ඇති වූ විචිකිච්ඡාව ප්‍රහාණය නොකළ විට නැවත නැවත උපදී. සාමඤ්ඤඵල සූත්‍රයේ දක්වා ඇත්තේ විචිකිච්ඡාව නම් සැකය ඇති තැනැත්තා වනයක අතරමං වූවකු ලෙසිනි. මෙම අට වැදෑරුම් වූ සැකය සසර මග දිගු කරයි. සසරෙහි ඇද බැඳ තබයි. ධර්මය මනාව ඉගෙනීමෙන්, තෙරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධාව ඇති කර ගැනීමෙන් මෙම සැකය ප්‍රහීණ කළ හැකිය.

***පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න. (ලකුණු 05යි.)***

**(iv) වටදාගෙය**

වටදාගෙය යනු ස්තූපය සඳහා ඉදි වූ වෘත්තාකාර පියස්සක් සහිත ගෘහය වේ. එය චෛතියඝර, ථූපඝර ආදී නම්වලින්ද හඳුන්වයි. ස්තූපයේ ආරක්ෂාව සඳහා එය නිමවා ඇත. ථූපාරාමය, අම්බස්තල, ලංකාරාම ආදී කුඩා ප්‍රමාණයේ ස්තූප සඳහා වටදාගෙය ඉදිකර තිබුණු බවට පුරාවිද්‍යාත්මක සාධක හමුවෙයි. පොළොන්නරුවේ හා මැදිරිගිරියේ වටදාගෙවල් කලාත්මක අතින් අග්‍රගන්‍ය නිර්මාණ ලෙස සැළකේ.

***පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න. (ලකුණු 05යි.)***

***